# රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# ප්‍රගති වාර්තාව

## அரசாங்க சேவை ஆணைக்குழுவின்
## முன்னேற்ற அறிக்கை

# Public Service Commission
# Progress Report

# 2018.07.01 – 2018.09.30

# පටුන


| අනු. අංකය | කාරණය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම | 01 |
| 02 | රාජ්‍ය සේවා කොමිෂන් සභා රැස්වීම් | 01 |
| 03 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංශ ක්‍රියාකාරකම් | 01 |
| | ආයතන අංශය | 01 |
| | පත්කිරීම් අංශය | 03 |
| | උසස්කිරීම් අංශය | 05 |
| | විනය අංශය | 07 |
| | අභියාචනා අංශය | 11 |
| 04 | අධ්‍යාපන සේවා කමිටුව | 13 |
| 05 | සෞඛ්‍ය සේවා කමිටුව | 16 |
| 06 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග | 18 |
| 07 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු | 19 |
| 08 | ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු | 20 |
| 09 | අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු | 21 |
| 10 | අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම් | 21 |
| 11 | මහජන පෙත්සම් කාරකසභාවේ පෙනී සිටීම් | 22 |

## හැඳින්වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54 (1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ නව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2015.10.15 දින සිට සිය රාජකාරි කටයුතු ආරම්භ කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව සෑම වසරකම පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ උපදෙස් මත සෑම කාර්තුවකට වරක් ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිතය. එසේ සෑම කාර්තුවකටම වරක් ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමට 2016 සැප්තැම්බර් මසදී දන්වන ලද බැවින් 2016.01.01 දින සිට 2018.06.30 දක්වාවන කාර්තු සඳහා කාර්තු ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී.

පාර්ලිමේන්තුවට කාර්තු වශයෙන් වාර්තා ඉදිරිපත් කල යුතු වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එහි ප්‍රගතිය මාසිකව ලබා ගෙන එම වාර්තා අධීක්ෂණය කරනු ලබයි. ඒ අනුව පසුගිය 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වාවන කාර්තුව ඇතුළත විශේෂ අවහිරතාවයකින් තොරව කොමිෂන් සභාවේ කටයුතු සිදුකර ඇත.

## 02. රාජ්‍ය සේවා කොමිෂන් සභා රැස්වීම්

2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා පවත්වන ලද රැස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මාසය | රැස්වීම් ගණන |
|---|---|
| ජූලි | 09 |
| අගෝස්තු | 09 |
| සැප්තැම්බර් | 08 |
| එකතුව | 26 |

## 03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංශ ක්‍රියාකාරකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් අංශ වලින් සමන්විත වන අතර, ඒවායින් ඉටු කරනු ලබන කාර්යයන් පහතින් දක්වා ඇත.

### I. ආයතන අංශය

අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනය මගින් සිදුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීම අනුව රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක්ද, එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නාවූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමද, ආයතන අංශය මගින් සිදුකරයි. එම සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමේදී, අනුමත සෑම තනතුරකටම නිලධරයන් බඳවා ගැනීමේදී අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමය, බඳවාගැනීමේ සුදුසුකම්, තනතුරට අදාළ වැටුප් පරිමාණය, සේවා කොන්දේසි, උසස් කිරීමේ ක්‍රමවේද සහ අදාළ අනෙකුත් සියලු විස්තර ඇතුළත් කිරීම සිදුකරයි. අදාළ සේවා ව්‍යවස්ථාව හෝ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීමට ප්‍රථම තනතුරු අනුමත කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ද, වැටුප් පරිමාණය සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ

නිර්දේශය ද, සේවා ව්‍යවස්ථාව හෝ බඳවාගැනීමේ පටිපාටි කෙටුම්පත සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය ද ලබාගනී.

**I.i. ආයතන අංශයෙහි කාර්යභාරය.**

I. රාජ්‍ය සේවයේ අනුමත සෑම සේවාවකටම සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කටයුතු.

II. එම සේවාවන්ගෙන් පරිබාහිර වන්නා වූ අනුමත සෑම තනතුරකටම බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමේ කටයුතු.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා විෂය පථයට අයත් බලතල පැවරීමට අදාළ කටයුතු.

IV. රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති පදනම් කරගත් උපදෙස් මාලා සකස් කිරීමේ කටයුතු.

V. සියලුම සේවාවන් සඳහා ස්ථාන මාරු පටිපාටි සකස් කිරීම හා සංශෝධනය කිරීම.

VI. අනුමත කරන ලද සේවා ව්‍යවස්ථාවක්, බඳවාගැනීමේ පටිපාටියක් හෝ ස්ථානමාරු පටිපාටියක් සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් අදාළ ලේකම්වරයාගේ නිර්දේශ මත එම ව්‍යවස්ථාව හෝ පටිපාටිය සංශෝධනය කර අනුමත කිරීමේ කටයුතු.

VII. බලය අභිනියෝජිත බලධරයන් විසින් කරනු ලබන පත්කිරීම්, උසස්කිරීම්වලට අදාළව පැන නගින ගැටළුවලට විසඳුම් ලබාගැනීම සඳහා එවනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ලබා දීමේ කටයුතු.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි, ස්ථානමාරු පටිපාටි, චක්‍රලේඛ සහ නියෝගවලින් බැහැරව කටයුතු කිරීමට සිදුවන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් පැනනගින ගැටළුවලට විසඳුම් ලබා දීමේ කටයුතු.

IX. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

**I.ii. ආයතන අංශයේ ප්‍රගතිය (2018. 07. 01 දින සිට 2018. 09. 30 දක්වා)**

| අනු අංකය | කාරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | නව බඳවා ගැනීමේ පරිපාටි | 22 |
| 02 | ස්ථාන මාරු පටිපාටි | 04 |
| 03 | උසස්කිරීම් පටිපාටි | 03 |
| 04 | බඳවා ගැනීමේ පටිපාටි සංශෝධන | 38 |
| 05 | සේවා ව්‍යවස්ථා සංශෝධන | 09 |
| 06 | ස්ථානමාරු පටිපාටි සංශෝධන | 03 |
| 07 | විශේෂ අවස්ථාවන්හීදී බඳවා ගැනීමේ පටිපාටි වලින් බැහැරවීම සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 09 |

| | | |
|---|---|---|
| 08 | විශේෂ අවස්ථාවන්හීදී සේවා ව්‍යවස්ථාවලින් බැහැරවීම සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 05 |
| 09 | ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 60 |
| 10 | පොදු කරුණු | 48 |
| 11 | ශ්‍රේෂ්ඨාධිකරණය, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, අභියාචනාධිකරණය සම්බන්ධ කරුණු | 04 |
| 12 | පරිපාලන බලතල පැවරීම | 03 |
| | **එකතුව** | **208** |




## II. පත්කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තා වූ ද , 1989/29 හා 2016.01.29 දිනැති, 1990/24 හා 2016.10.27 දිනැති, 1992/7 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබ ඇත්තා වූ ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පවරා නොමැති, රාජ්‍ය නිලධාරීන් ( අමාත්‍යාංශ ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර ) සම්බන්ධයෙන් වන පත්කිරීම් පිළිබඳ පහත දැක්වෙන කර්තව්‍යයන් පත්කිරීම් අංශය මඟින් ඉටු කරනු ලැබේ.

### II.i. පත්කිරීම් අංශයෙහි කාර්යභාරය

I. අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනිම් පටිපාටි/ උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම.

II. සේවයේ ස්ථිර කිරීම , සේවය අවසන් කිරීම , කලින් දැරූ තනතුරට පෙරළා යැවීම.

III. වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීම.

IV. මුදා හැරීම. (ස්ථිර / තාවකාලික)

V. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම , සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයට / තනතුරට නැවත පත්කිරීම , විශ්‍රාම ගැන්වීම. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/88 අනුව, වෛකල්පිත, වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත, වෛද්‍ය හේතූන් මත )

VI. විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම . සේවා ව්‍යවස්ථාවන්හි උප ලේඛණගත තනතුරුවලට (අදාළ අවස්ථාවන්හිදී) පත්කිරීම.


VII. මාණ්ඩලික නිලධාරීන්ගේ පත්කිරීම්වලට අදාළව සෞඛ්‍ය සේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් පනවනු ලැබ ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

VIII. ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග / තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ හා වාර්තා ඉදිරිපත් කිරීම , මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් , මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අවශ්‍ය නිරීක්ෂණ වාර්තා සැපයීම හා අවශ්‍ය තැන්හීදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝජනය කිරීම

IX. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

### II.ii පත්කිරීම් අංශයේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දක්වා)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විශ්‍රාම ගැන්වීම් | 140 |
| 02 | ස්ථිර කිරීම් | 114 |
| 03 | බඳවා ගැනීම් | 408 |
| 04 | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම් | 341 |
| 05 | කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් | 04 |
| 06 | කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 243 |
| 07 | වැඩ බැලීමට / රාජකාරි ඉටුකිරීමට පත්කිරීම් | 379 |
| 08 | මුදාහැරීම් | 35 |
| 09 | ඉල්ලා අස්වීම් | 04 |
| 10 | අන්තර්ග්‍රහණය කිරීම් | 129 |
| | **එකතුව** | **1797** |




### III. උසස්කිරීම් අංශය

අංක 1955/22 හා 2016.02.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්තා වූද, 1989/29 හා 2016.01.29 දිනැති, 1990/24 හා 2016.10.27 දිනැති, 1992/7 හා 2016.11.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරනු ලැබ ඇත්තා වූද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වෙනත් අභිනියෝජිත බලධරයෙකු වෙත පවරා නොමැති රාජ්‍ය නිලධාරීන් (අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවයේ හා අධිකරණ නිලධාරීන් හැර) සම්බන්ධයෙන් වන පත්කිරීම් / උසස්කිරීම් පිළිබඳ කර්තව්‍යයන් උසස්කිරීම් අංශය මගින් ඉටු කරනු ලැබේ.

### III.i. උසස් කිරීම් අංශයෙහි කාර්යභාරය

I. එක් එක් සේවාවන් හෝ නිලධර කාණ්ඩ සඳහා අනුමත සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි, උසස් කිරීම් පටිපාටි, අනුව ශ්‍රේණියෙන් ශ්‍රේණියට සිදු කරන උසස් කිරීම් මෙන්ම ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තරගකාරී විභාග, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින් තෝරා ගැනීම් මත සිදු කරනු ලබන උසස්කිරීම්.

II. ජ්‍යෙෂ්ඨතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත මෙන්ම උසස් කිරීම් මත නිලධාරීන් අදාළ තනතුරුවලට පත්කිරීම.

III. දීප ව්‍යාප්ත සේවාවන්හී 1 ශ්‍රේණියේ හා ඉන් ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් තනතුරකින් තනතුරකට මාරු කිරීමේදී ඊට පූර්ව අනුමැතිය ලබා දී අදාළ නව තනතුරට පත් කිරීම.

IV. ප්‍රාදේශීය ලේකම් තනතුරට පත්කිරීම් (ස්ථිරව, වැඩ බැලීමට, රාජකාරි ඉටු කිරීමට)

V. මාණ්ඩලික නිලධාරීන්ගේ උසස්කිරීම්වලට අදාළව සෞඛ්‍ය සේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් පනවනු ලැබ ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම


VI. ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග / තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ හා අවශ්‍ය වාර්තාවන් ඉදිරිපත් කිරීම.

VII. මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අවශ්‍ය නිරීක්ෂණ වාර්තා සැපයීම හා අවශ්‍ය තැන්හීදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝජනය කිරීම.

VIII. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

### III.ii. උසස්කිරීම් අංශයේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දක්වා)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්කිරීම් | 156 |
| 02 | තෝරාගැනීම් මත උසස්කිරීම් | 26 |
| 03 | තනතුරුවලට පත්කිරීම් | 164 |
| 04 | වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට පත්කිරීම් | 21 |
| | **එකතුව** | **367** |




### I V. විනය අංශය

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 හා දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන් හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1955/22 හා 2016.02.25 හා අංක 2016/37 හා 2017.04.26 දිනවලින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ විනය කටයුතු මෙම අංශය මගින් සිදු කරනු ලැබේ. විනය අංශය වෙත ලැබෙන සියලුම ලිපිලේඛන පිළිබඳව සවිස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර අපක්ෂපාතී තීරණ ගැනීම සඳහා නිරවුල්ව, එම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කරමින් අවශ්‍ය සහයෝගය ලබා දෙයි.

### I V.i විනය අංශයෙහි කාර්යභාරය

ඉහත ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම.

### 1. විනය කටයුත්තක් සම්බන්ධයෙන්

I. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් සිදු කරන ලද මූලික විමර්ශන වාර්තාවක් විනය අංශයට ලැබීමෙන් අනතුරුව එය පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කොට අදාළ තොරතුරු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සම්පූර්ණ කරගැනීමෙන් පසුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව

චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම පිළිබඳ සුදුසු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

II. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කළහොත් එම චෝදනා පත්‍රය අදාළ නිලධාරියාට පරිපාලන බලධරයා හා අමාත්‍යංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් භාර දීමට කටයුතු කරනු ලබන අතර එම චෝදනා පත්‍රයට චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන පිළිතුර සහ ඒ සම්බන්ධව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ තීරණයක් ගනු ඇත.

III. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළහොත් ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයෙන් සුදුසු නිලධාරියෙකු පරීක්ෂණ නිලධාරී ලෙස පත්කර එම විධිමත් විනය පරීක්ෂණය සිදු කරන ලෙස නියම කරනු ලැබේ. යම් හෙයකින් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වීමට තීරණය කළහොත් චූදිත නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති පිළිතුර හා ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහ අදාළ අමාත්‍යංශ ලේකම්ගේ හා පරිපාලන බලධරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කර ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ සුදුසු විනය දඬුවමක් පැනවීම හෝ සිදු කරනු ලබයි.

IV. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වුණි නම් එම පරීක්ෂණයේ වාර්තාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබුණ පසු එම විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සියලුම වාචික හා ලිඛිත සාක්ෂි ද පරීක්ෂණ නිලධාරිගේ , පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරිගේ සහ රැකවරණ නිලධාරිගේ වාර්තාවන් ද සැලකිල්ලට ගනිමින් චූදිත නිලධාරියා සියලු චෝදනාවලින් නිදහස් කිරීම හෝ චෝදනා එකකට, කිහිපයකට හෝ සියල්ලටම වරදකරු කොට සුදුසු විනය නියෝගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

V. තවද විනය ක්‍රියාපටිපාටියේ කොටසක් වශයෙන් කිසියම් චූදිත නිලධාරියෙක් වැඩ තහනමට ලක් කිරීම හෝ එවැනි වැඩ තහනමේ පසුවන නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීම හෝ අනිවාර්ය නිවාඩු මත තැබීම හෝ නොනිම් විනය කරුණු පවතිද්දී අදාළ නිලධාරියා විශ්‍රාම ගන්වන්නේ නම් එකී විශ්‍රාම ගැන්වීම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්ව කිරීම හෝ සිදු කරනු ලැබේ.

## 2. අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ සෞඛ්‍ය සේවා කමිටුව විසින් ලබා දෙන විනය නියෝගවලට අදාළව කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව 2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට අධ්‍යාපන සේවා කමිටුව විසින් සහ 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ට සෞඛ්‍ය සේවා කමිටුව විසින් පනවනු ලබන විනය නියෝගයන්ට එරෙහිව එම නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු ද එම අභියාචනා සම්බන්ධයෙන් අදාළ කමිටුව විසින් සහ එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත්

කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් වෙත සහන සැලසීම / අභියාචනා ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

**3. සේවය හැරයාමේ නිවේදනවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන්**

2016.10.19 දිනැති අංක 1989/27, 1989/28, 1989/29 හා 2016.11.07 දිනැති අංක 1992/7 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හා 2016.10.27 දිනැති අංක 1990/24 , 1990/25 දරණ අති විශේෂ ගැසට් නිවේදන අනුව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ වන නිලධාරීන්ගේ හැර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම දැක්වෙන අංක 1955/22 හා 2016.02.25, අංක 2016/37 හා 2017.04.26 දින වලින් සංශෝධිත අංක 1941/41 හා 2015.11.20 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නිලධාරීන්ගේ සේවය හැරයාමේ නිවේදනවලට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනාවල සඳහන් කරුණු සහ එම අභියාචනා සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ පරිපාලන බලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ ද සැලකිල්ලට ගෙන එකී නිලධාරීන් සුදුසු පරිදි නැවත සේවයේ පිහිටුවීම/ නොපිහිටුවීම සිදු කරනු ලැබේ.

**4. උපරිමාධිකරණ, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන්**


කොමිෂන් සභාව විසින් පනවනු ලබන විනය නියෝගවලට හෝ එවැනි විනය කටයුතු පිළිබඳ තීරණයන්ට එරෙහිව උපරිමාධිකරණයට ගොනු කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙත සහ ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් නිරීක්ෂණ සැකසීම හා අභියාචනා කැඳවනු ලබන දිනවලදී එම ආයතනයන්හි පෙනී සිටීම ද මානව හිමිකම් කොමිසම විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කිරීම ද කරනු ලැබේ.

**5. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු**

**IV.ii. විනය අංශයේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දක්වා)**

| අනු අංකය | කාරණය | නියෝග ගණන 2018.07.01 සිට 2018.09.30 දක්වා |
|---|---|---|
| 01 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 03 |
| 02 | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 04 |
| 03 | චෝදනා වලින් නිදහස් කිරීම | 03 |
| 04 | අනෙකුත් විනය දඬුවම් | 03 |
| 05 | නැවත සේවයේ පිහිටුවීම | 01 |
| 06 | අභියාචනා ප්‍රතික්ෂේප කිරීම | 05 |
| 07 | විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම | 12 |
| 08 | විනය හේතු මත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම | 09 |

| | | |
|---|---|---|
| | ගැන්වීමක් බවට පරිවර්ථනය කිරීම | |
| 09 | සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 01 |
| 10 | විනය කටයුතු අවසන් කිරීම් | 04 |
| 11 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 33 |
| 12 | පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ විභාග වන අභියාචනා සඳහා නිරීක්ෂණ | 22 |
| | **එකතුව** | 100 |




### V. අභියාචනා අංශය

බලය අභිනියෝජිත බලධරයෙකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහාත්, එම අභියාචනා සම්බන්ධයෙන් නියමිත කාල රාමුව තුළදී තීරණ ලබා දීම සඳහාත්, කොමිෂන් සභාවට සහය ලබා දීම අභියාචනා අංශය මගින් සිදු කරයි.

### V.i . අභියාචනා අංශයේ කාර්යභාරය.

I. එක් එක් අභියාචනය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තා කැඳවීම හා ඉන් පසුව එක්

එක් අභියාචනය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම

II. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණ අභියාචක වෙත හා අනිකුත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීම.

III. අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙන තීරණවලට එරෙහිව, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා සකස් කිරීම සහ එම අභියාචනා විභාගයට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් එම අධිකාරය ඉදිරියේ පෙනී සිටීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

V. මහජන පෙත්සම් කාරක සභාව විසින් විභාගයට ගනු ලබන පෙත්සම් සම්බන්ධයෙන් එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ / නිර්දේශ ඉදිරිපත් කිරීම.

VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණ සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කරනු ලබන පෙත්සම්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිරණ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අයදුම්පත්වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.


IX. ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

X. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

**V.i i . අභියාචනා අංශයේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දක්වා)**

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා ලැබුණු අභියාචනා ප්‍රමාණය | 379 |
| 02 | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා බලය අභිනියෝජිත බලධරයන් වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවා ඇති අභියාචනා ප්‍රමාණය (පෙර වර්ෂයන්හී ඉදිරිපත් වූ අභියාචනාද ඇතුළත්ව) | 293 |

| | | | |
|---|---|---|---|
| 03 | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය (පෙර වර්ෂයන්හි අභියාචනාද ඇතුළත්ව) | | 412 |
| | කටයුතු නිම කළ අභියාචනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. | | |
| | විනය කරුණු සම්බන්ධ අභියාචනා | 75 | |
| | උසස් වීම් සම්බන්ධ අභියාචනා | 22 | |
| | තනතුර අතහැර යාමේ නිවේදනය සම්බන්ධ අභියාචනා | 118 | |
| | ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා | 114 | |
| | පත්කිරීම් සම්බන්ධ අභියාචනා | 9 | |
| | වැඩ තහනම් කිරීම සම්බන්ධ අභියාචනා | 5 | |
| | වෙනත් | 69 | |
| | එකතුව | 412 | |




## 04. අධ්‍යාපන සේවා කමිටුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 1989/27 හා 2016.10.19 දිනැති ගැසට් නිවේදනය මගින් අධ්‍යාපන සේවා කමිටුව පත්කර ඇත.

අංක 1989/29 හා 2016.10.19 දිනැති, අංක 1992/7 හා 2016.11.07 දිනැති හා අංක 2014/3 2017.04.11 දිනැති ගැසට් නිවේදන මගින් උක්ත කමිටුව වෙත බලතල පැවරීම් හා සංශෝධනය කිරීම් සිදුකර ඇත.

අංක 2014/3 හා 2017.04.11 දිනැති ගැසට් නිවේදනය මගින් පවරන ලද බලතල අනුව 2017.04.07 දින සිට අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යයන් සිදුකෙරේ.

### 4.1 අධ්‍යාපන සේවා කමිටුවේ කාර්යභාරය

අංක 2014/03 හා 2017.04.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අධ්‍යාපන සේවා කමිටුව පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරනු ලැබේ.

i. අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීම් පටිපාටි අනුව බඳවාගැනීම, සේවයේ ස්ථිර කිරීම, සේවය අවසන් කිරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම, වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කිරීම, මුදා හැරීම (ස්ථිර/තාවකාලික), සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය හැර යාමේ නිවේදනවලට එරෙහි අභියාචනා පිළිබඳව සළකා බැලීම, සේවයට/ තනතුරට නැවත පත් කිරීම, විශ්‍රාම ගැන්වීම හා විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම.

ii. අනුමත සේවා ව්‍යවස්ථා / බඳවා ගැනීම් පටිපාටි / උසස්කිරීම් පටිපාටි අනුව උසස්කිරීම. (ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත)

iii. කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම.

iv. අධ්‍යාපන සේවා කමිටුවේ විෂය පථයට අයත් නිලධාරීන්ට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම.

v. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

### 4.2. අධ්‍යාපන සේවා කමිටුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග

I. කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් රාජකාරි ඉටු කිරීමේදී ඇතිවන ගැටළු පිළිබඳව අංශයේ නිලධාරීන් එකතුව සාකච්ඡා පැවැත්වීම.


II. සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් නොපමාව ඉටු කල යුතු කාර්යයන් කඩිනමින් ඉටු කිරීම හා නිවාඩු දිනයන්හිදී රාජකාරි සඳහා පැමිණීම.

III. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් පිළිතුරු ලිපි එවීමට ප්‍රමාදවන අවස්ථාවලදී සිහිකැඳවීම් ලිපි යැවීම

IV. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් පිළිතුරු ලිපි එවීමට ප්‍රමාදවන අවස්ථාවලදී නොපමාව කටයුතු කළයුතු ලිපි සඳහා අමාත්‍යාංශය වෙත දුරකථන ඇමතුම් ලබා දී අවශ්‍ය තොරතුරු ෆැක්ස් මගින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම

4.3 අධ්‍යාපන සේවා කමිටුවේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දක්වා)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| 01 | බඳවා ගැනීම් | 07 | |
| | විශ්‍රාම ගැන්වීම් | 105 | |
| | ස්ථිර කිරීම් | 70 | |
| | උසස් කිරීම් | 845 | |
| | අන්තර්ග්‍රහණය කිරීම් | 39 | |
| | මුදා හැරීම් | 23 | |
| | ස්ථාන මාරු කිරීම් | 12 | |
| | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 54 | |
| | භාෂා ප්‍රවීනතා සහන | 01 | |
| | තනතුරුවලට පත්කිරීම් | 01 | |
| | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනිම් | 02 | |
| | අනෙකුත් නියෝග | 20 | |
| | **එකතුව** | | **1179** |
| 02 | **විනය** | | |
| | චෝදනා පත්‍ර නිකුත් කිරීම් | 07 | |
| | චෝදනා පත්‍ර සංශෝධනය කිරීම් | 05 | |
| | විනය කටයුතු අවසන් කිරීම් | 01 | |
| | චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීම් | 02 | |
| | විනය දඬුවම් | 05 | |
| | විනය පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම් | 02 | |
| | අනෙකුත් සාමාන්‍ය නියෝග | 23 | |
| | **එකතුව** | | **45** |
| 03 | **දේශපාලන පළිගැනීම්** | | |
| | සාමාන්‍ය නියෝග | 21 | |
| | | | **21** |
| | එකතුව | | **1245** |




## 5. සෞඛ්‍ය සේවා කමිටුව

අංක 2004/49 හා 2017.02.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සහ 2009/18 හා 2017.03.08 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත අංක 1990/24 දරණ 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016 නොවැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා කමිටුව වෙත බලතල පැවරී ඇත. අංක 1990/25 දරණ 2016.10.27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2016.10.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම කමිටුව සඳහා සාමාජිකයින් පත් කර ඇත.

### 5.1. සෞඛ්‍ය සේවා කමිටුවේ කාර්යභාරය

I. අනුමත සේවා ව්‍යවස්ථා/ බඳවා ගැනීම් පටිපාටි අනුව බඳවා ගැනීම්/ සේවය ස්ථිර කිරීම්, සේවයට/ තනතුරට නැවත පත්කිරීම, මුදා හැරීම, වැඩ බැලීම/ රාජකාරි ඉටු කිරීම,සේවයෙන් ඉල්ලා අස්වීම, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම, සේවය හැරයාමේ නිවේදනවලට එරෙහි අභියාචනා පිළිබඳ සළකා බැලීම

II. අනුමත සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීම් පටිපාටි, උසස් කිරීම් පටිපාටි අනුව උසස් කිරීම (ශ්‍රේණියෙන් ශ්‍රේණියට / ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව)

III. කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම

IV. සෞඛ්‍ය සේවා කමිටුවේ විෂය පථයට අයත් නිලධාරීන්ට අදාළව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම

### 5.2. සෞඛ්‍ය සේවා කමිටුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත යොමු කරන බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විවිධාකාර රාජකාරිමය ගැටළු පැන නැගීම නිසා ඇතිවන ප්‍රමාදයන් වැළැක්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සමග අවශ්‍ය අවස්ථාවනිහීදී රැස්වීම් පවත්වා විසඳුම් ලබා ගැනීමට කටයුතු කිරීම

II. මෙම අංශයට නවක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නවක නිලධාරීන් දෙදෙනෙක් අනුයුක්ත කල අතර එම නිලධාරීන් දෙදෙනාට වෛද්‍ය නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම, විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සහ විනය කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමට පැවරීම

III. සෞඛ්‍ය සේවා කමිටුව වෙතින් ඵලදායී සේවාවක් ලබා දීමේ අරමුණින් රාජකාරි ඉටු කිරීමේදී ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අංශයේ නිලධාරීන් එකතු වී සාකච්ඡා කිරීම

IV. සෞඛ්‍ය සේවා කමිටුව වෙත පැවරෙන රාජකාරි ඉටු කිරීම සඳහා නිවාඩු දිනයන්හීදී රාජකාරි සඳහා පැමිණීම


V. ලැබෙන ලිපි LMS (Letter Management System) පද්ධතියට ඇතුළත් කිරීම මගින් අදාළ ලිපි සම්බන්ධයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම පහසු වීම

### 5.3. සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය (2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා)

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | විශ්‍රාම ගැන්වීම් | 61 |
| 02 | ස්ථිර කිරීම් | 522 |
| 03 | බඳවා ගැනීම් | 1453 |
| 04 | 2017 වර්ෂයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද මෙතෙක් විධිමත් පත්වීම් ලිපි නිකුත් කර නොමැති වෛද්‍යවරුන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම | 95 |
| 05 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 108 |
| 06 | උසස්කිරීම් | 513 |
| 07 | තනතුරුවලට පත්කිරීම් | 03 |
| 08 | විශේෂ ශ්‍රේණියට පත් කිරීම | 40 |
| 09 | මුදා හැරීම් | 15 |
| 10 | ස්ථානමාරු කිරීම | 103 |
| 11 | කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධ තීරණ | 38 |
| 12 | ඉල්ලා අස්වීම් | 05 |

| | | |
|---|---|---|
| 13 | වැඩ බැලීම | 13 |
| 14 | චෝදනා පත්‍ර නිකුත් කිරීම | 05 |
| 15 | චෝදනාපත්‍ර නිකුත් නොකර චෝදනාවලින් නිදහස් කිරීම | 02 |
| 16 | සෙසු විනය දඬුවම් | 03 |
| 17 | විධිමත් විනය පරීක්ෂණ සඳහා නිලධාරීන් පත් කිරීම | 05 |
| 18 | අනෙකුත් සාමාන්‍ය නියෝග | 23 |
| | **එකතුව** | **3007** |

**සෞඛ්‍ය සේවා කමිටුවේ ප්‍රගතිය**
**(2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා)**



## 06. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවා දායකයාට ලබාදෙන සේවය වඩාත් කාර්යක්ෂම හා සඵලදායීව ඉටුකිරීම සඳහා මෙකී කාල පරිච්ඡේදය තුළ පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**ආයතන අංශය**

I. ආයතන අංශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා සෑම මාසයකට වරක්ම සිහි කැඳවීම් ලිපි යැවීම.

II. ගැටළු සාකච්ඡා කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයේ ඒ ඒ විෂය පිළිබඳ පළපුරුදු නිලධාරීන් කැඳවා සාකච්ඡා පැවැත්වීම.

III. පිළිතුරු ලිපි එවීමට ප්‍රමාද වන අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලට දුරකථන ඇමතුම් ලබා දී අවශ්‍ය තොරතුරු ෆැක්ස් මගින් ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

IV. සෑම වර්ෂයකම සියලුම අමාත්‍යාංශවල පාලන කටයුතු භාර අතිරේක ලේකම්වරු කැඳවා ඊට පෙර වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග රාජකාරි කිරීමේදී මුහුණදීමට සිදුවූ ගැටළු පිළිබඳ සමාලෝචනය කිරීම

V. සෑම මසකම කාර්ය මණ්ඩල රැස්වීම් පවත්වා එක් එක් නිලධාරියාගේ රාජකාරිවලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම, රාජකාරි අධික නිලධාරින්ගේ වැඩ බෙදීම

**පත්කිරීම් අංශය**

I. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට පුහුණු අවස්ථා සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙමින් ඔවුන්ගේ ආකල්ප හා දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීම

II. සති අන්ත දින දෙකක් අංශයේ මාණ්ඩලික නිලධාරීන්ද ඇතුළුව සියලු දෙනා රාජකාරියට වාර්තා කර අතපසු වූ රාජකාරි කටයුතු අවසන් කිරීම

III. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේදී ඇති වන ප්‍රමාදයන් අවම කර ගනිමින් සේවා අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්ට කඩිනම් සේවයක් සැලසීම සඳහා විධිමත්ව සිහි කැඳවීම් කරමින් හා ලිපි හුවමාරුව අවම වන පරිදි සාකච්ඡා පැවැත්වීමෙන් පත්කිරීම් අංශයේ කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.

IV. නිශ්චිත කාල රාමුවක් තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග ලබා ගැනීමට ක්‍රියාත්මක කිරීමට අංශයේ සියලුම නිලධාරීන්ට ඉලක්ක ලබා දෙමින් ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

**උසස්කිරීම් අංශය**

i. අංශයේ කටයුතු කාර්යක්ෂම කිරීමට නව මඟ පෙන්වීම් හා උපදෙස් ලිපි පරිපාලන බලධාරීන් වෙත නිකුත් කරන ලද අතර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ

නිලධාරීන්ට පුහුණු අවස්ථා සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දෙමින් ඔවුන්ගේ ආකල්ප හා දැනුම වර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

ii. සති අන්ත දින දෙකක් අංශයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව සියලු දෙනා රාජකාරියට වාර්තා කර අතපසු වූ රාජකාරි කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම

iii. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේදී ඇති වන ප්‍රමාදයන් අවම කර ගනිමින් සේවා අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්ට කඩිනම් සේවයක් සැලසීම සඳහා විධිමත්ව සිහි කැඳවීම් කරමින් හා ලිපි හුවමාරුව අවම වන පරිදි සාකච්ඡා පැවැත්වීමෙන් උසස්කිරීම් අංශයේ කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.

**<u>විනය අංශය</u>**

i. තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම සඳහා එක් එක් පද්ධතියට වෙන වෙනම නිලධාරීන් නම් කිරීම

**<u>අභියාචනා අංශය</u>**

i. අභියාචනා අංශය වෙත ඉදිරිපත්වී ඇති අභියාචනාවලට අදාළව බලය අභිනියෝජිත බලධරයින් වෙතින් නිරීක්ෂණ / නිර්දේශ වාර්තා ගෙන්වා ගැනීම කඩිනම් කිරීම සඳහා සිහි කැඳවීම් ලිපි යැවීම හා ඒ මගින් අමාත්‍යාංශ ලේකම්වරුන් ඒ පිළිබඳව දැනුවත් කිරීම

**07. සමාලෝචිත කාල පරිච්ඡේදය තුල පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි පිළිබඳ විස්තර**

| අංශය | 2018.07.01 දිනට නිම නොවී තිබූ පැමිණිලි සංඛ්‍යාව | 2018.07.01 සිට 2018.09.30 දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 2018.07.01 සිට 2018.09.30 දක්වා නිශ්චිත කළ/ ඉවත් කළ පැමිණිලි සංඛ්‍යාව | 2018.09.30 දින වන විට ලැබී තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ සනාථ කළ පැමිණිලි සංඛ්‍යාව | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ අවලංගු කළ පැමිණිලි සංඛ්‍යාව | 2018.09.30 දිනට නිම නොවූ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| ආයතන | 33 | 02 | 05 | 30 | 0 | 02 | 28 |
| පත්කිරීම් | 87 | 03 | 00 | 90 | 09 | 00 | 81 |
| උසස්කිරීම් | 70 | 02 | 00 | 72 | 01 | 01 | 70 |
| විනය | 113 | 02 | 16 | 115 | 13 | 03 | 99 |
| අභියාචනා | 160 | 28 | 29 | 188 | 00 | 00 | 159 |

08. සමාලෝචිත කාල පරිච්ඡේදය තුල ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු

| අංශය | 2018.07.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා ලැබුණු සංඛ්‍යාව | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා ඉවත් කළ නඩු සංඛ්‍යාව | 2018.09.30 දින වන විට ලැබී තිබූ මුළු නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිරණය විසින් නිශ්ප්‍රභා කල නඩු සංඛ්‍යාව හා රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණයට එකඟ වූ නඩු සංඛ්‍යාව | ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ අවලංගු කල සංඛ්‍යාව | 2018.09.30 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| ආයතන | 66 | 05 | 06 | 65 | 01 | 0 | 64 |
| පත්කිරීම් | 39 | 03 | 00 | 42 | 01 | 00 | 41 |
| උසස්කිරීම් | 42 | 03 | 00 | 45 | 00 | 00 | 45 |
| විනය | 10 | 00 | 00 | 10 | 00 | 00 | 10 |
| අභියාචනා | 36 | 01 | 00 | 37 | 00 | 00 | 37 |
| අධ්‍යාපන සේවා කමිටුව | 03 | 01 | 00 | 04 | 00 | 00 | 04 |
| සෞඛ්‍ය සේවා කමිටුව | 07 | 02 | 00 | 09 | 01 | 00 | 08 |

09. සමාලෝචිත කාල පරිච්ඡේදය තුල අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කර ඇති නඩු සම්බන්ධ තොරතුරු

| අංශය | 2018.07.01 දිනට නිම නොවී තිබූ සංඛ්‍යාව | 2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා ලැබුණු නඩු සංඛ්‍යාව | 2018.09.30 දින වන විට ලැබී තිබූ මුළු නඩු සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා තිරණය සනාථ කල සංඛ්‍යාව | අභියාචනාධිකරණය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ අවලංගු කර සහන සැලසූ සංඛ්‍යාව | 2018.09.30 දිනට නිම නොවූ නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ආයතන | 11 | 00 | 11 | 00 | 00 | 11 |
| පත්කිරීම් | 14 | 00 | 14 | 00 | 00 | 14 |
| උසස්කිරීම් | 04 | 00 | 04 | 00 | 00 | 04 |
| විනය | 07 | 02 | 09 | 00 | 00 | 09 |
| අභියාචනා | 05 | 00 | 05 | 00 | 00 | 05 |

## 10. අමාත්‍යාංශමය හා දෙපාර්තමේන්තුමය රැස්වීම්

| අනු අංකය | දිනය | කාරණය | සහභාගී වූ දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ/ ආයතන |
|---|---|---|---|
| 01 | 2018.07.09 | මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 පන්තියේ මෝටර් වාහන පරීක්ෂණවරුන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 02 | 2018.07.26 | කළමනාකරණ සහකාර අධි පන්තියට අයත් පරිපාලන ග්‍රාම නිලධාරී තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 03 | 2018.08.03 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම හා බඳවා ගැනීම්වලට අදාළ ගැටළු | අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය |
| 04 | 2018.08.04 | ශ්‍රී ලංකා විදේශ සේවයේ අධි සේවක පදනම මත අතීතයට බලපාන පරිදි තනතුරක් ඇති කිරීම | විදේශ කටයුතු අමාත්‍යාංශය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| 05 | 2018.08.03 | සහකාර මුද්‍රණාලයාධිපති (නිෂ්.) තනතුරේ පුරප්පාඩු පිරවීම | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |
| 06 | 2018.08.06 | දුම්රිය ආරක්ෂක සේවයේ පවතින ගැටළු | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය දුම්රිය දෙපාර්තමේන්තුව |
| 07 | 2018.08.07 | දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළව විවෘත බඳවා ගැනීමට අදාළ ක්‍රමවේදයක් සකස් කිරීම | රාජ්‍ය පරිපාලන, කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විභාග දෙපාර්තමේන්තුව |
| 08 | 2018.08.09 | ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු | ආයුර්වේද දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 09 | 2018.08.13 | ශ්‍රී ලංකා ආයුර්වේද සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය සම්බන්ධ ගැටළු | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 10 | 2018.08.13 | MN -03 වැටුප් කාණ්ඩයට අයත් තැපැල් සේවා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධව මතුවී ඇති ගැටළු | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය තැපැල් දෙපාර්තමේන්තුව |
| 11 | 2018.08.14 | කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම කේ.කේ.මොහොමඩ් මයා - දුම්රිය ස්ථානාධිපති (ආවරණ) | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| 12 | 2018.08.16 | ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු | ආයුර්වේද දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 13 | 2018.08.17 | සංඛ්‍යාලේඛණඥ විධායක සේවා ශ්‍රේණිය III ශ්‍රේණියට බඳවා ගැනීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 14 | 2018.08.20 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධව | රාජ්‍ය පරිපාලන, කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| 15 | 2018.08.21 | ඖෂධ සංයෝජක නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය බන්ධනාගාර මූලස්ථානය |
| 16 | 2018.08.29 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියේ නිලධාරීන් විශේෂ පන්තියට උසස් කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 17 | 2018.09.04 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III (විවෘත) බඳවා ගැනීම | රාජ්‍ය පරිපාලන, කළමනාකරණ, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය |
| 18 | 2018.09.20 | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ස්ථාන ගත කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 19 | 2018.09.28 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට විශේෂ සේවක සංඛ්‍යාව යටතේ බඳවා ගත් නිලධාරීන්ට විදුහල්පති තනතුරු සඳහා පත්වීම් ලබා දීම | අධ්‍යාපන අමාත්‍යාංශය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| 20 | 2018.09.28 | විධායක තනතුරුවලට බඳවා ගැනීම | වාණිජ දෙපාර්තමේන්තුව |

## 11. මහජන පෙත්සම් කාරකසභාවේ පෙනීසිටීම

2018.07.01 දින සිට 2018.09.30 දින දක්වා පෙනී සිටි මහජන පෙත්සම් කාරක සභාවේ විමසීම් සංඛ්‍යාව 07 කි.

------------------------------------ //------------------------------------